# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

# පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

දිවයිනේ පළාත් පාලන ආයතනවල ප්‍රාග්ධන ආයෝජනය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම සහ ණය ආපසු අයකිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටුකරන දේශීය ණය සහ සංවර්ධන අරමුදල වර්ෂ 1916 අංක 22 දරන ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර මෙම අරමුදල රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වේ. මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා ගිණුම්)

### (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

**01. සේවා ගණය : "කළමනාකාර"**

**02. "කළමනාකාර" සේවා ගණයේ තනතුරු දරන්නන්ට පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :**

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සාධනය, විධානය/ අණ දීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගිණිය හැක්කා වූද, කාර්යයන් අතුරින් ආයතනයේ ඉහළ විධායක නිලධාරියාගේ කාර්යභාරයට උපස්ථම්භක/ පහසුකාරක වන පරිදි තනතුරු විශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන්.

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් , ගණකාධිකරණය, මානව සම්පත් කළමනාකරණය, වාණිජ්‍ය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය යන උපාධිවලින් එකක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම. **සහ**

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකර" JMසේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**04. වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය *

**2020.01.01 දින සිට,**

**MM 1-1 : රු. ( 53,175 - 10 X 1,375 - 15 X 1,910 - 95,575)**

**(රජයේ අනුමත දීමනා එකතුවේ)**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)

### (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

**01. සේවා ගණය : "කළමනාකාර"**

**02. "කළමනාකාර" සේවා ගණයේ තනතුරු දරන්නන්ට පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :**

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සාධනය, විධානය/ අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගිණිය හැක්කා වූ ද කාර්යයන් අතුරින් ආයතනයේ ඉහළ විධායක නිලධාරියාගේ කාර්යභාරයට උපස්ථම්භක/ පහසුකාරක වන පරිදි තනතුරු විශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන්.

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය , මානව සම්පත් කළමනාකරණය, වාණිජ්‍ය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය යන උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම. **සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :- (පහත සඳහන් 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකර" JMසේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය *

**2020.01.01 දින සිට,**

**MM 1-1 : රු. (53,175 - 10 X 1,375 - 15 X 1,910 - 95,575)**

**(රජයේ අනුමත දීමනා එකතුවේ)**

## අභ්‍යන්තර විගණන නිලධාරි

### (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

**01. සේවා ගණය : "කනිෂ්ඨ කළමනාකාර"**

**02. සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ කළමනාකාර ශ්‍රේණීන්හි නියතු වූවන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි විශේෂිත කොට කළමනාකාර/ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ශ්‍රේණීන්හි නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව පවරා දෙනු ලබන පරිපාලනමය, පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන්

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලන, වාණිජ්‍ය උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්න වූ, පිළිගත් වරලත් වූ වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය *

**2020.01.01 දින සිට,**

**JM 1-1 : රු. ( 42,600 - 10 X 755 - 18 X 1,135 - 70,580)**

**(රජයේ අනුමත දීමනා එකතුවේ)**

## සංවර්ධන සහකාර

### (පුරප්පාඩු සංඛ්‍යාව - 04)

**01. සේවා ගණය : ආශ්‍රිත නිලධාරීන්**

**02. සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී ජ්‍යෙෂ්ඨ කළමනාකාර/ කළමනාකාර මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නාවූ, විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම/ විශ්ලේෂණය/ සම්පාදනය, වාර්තා සම්පාදනය, සමීක්ෂණ වැනි කාර්යයන් අතුරින් නිශ්චිත කාර්යභාරයක් වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූද, කාර්යභාරයන් පැවරෙන සේවා ගණයකි.

**03. සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණ, අලෙවිකරණය, ආර්ථික විද්‍යාව, මූල්‍ය, සංඛ්‍යානය, මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**04. වයස් සීමාව**

අවු : 22 ට නො අඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවනට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

**2020.01.01 දින සිට**

**MA 3: රු. (32,200 - 10 X 445 - 11 X 660 - 10 X 730 - 5 X 750 - 54,960)**

**(රජයේ අනුමත දීමනා එකතුවේ)**

**සැ යු : යාපනය, වව්නියාව/මන්නාරම, මුලතිව්/ කිලිනොච්චි, අම්පාර, කෑගල්ල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර රාජකාරී සඳහා පුරප්පාඩු පවතී.**

## කළමනාකරණ සහකාර

### (පුරප්පාඩු සංඛ්‍යාව - 03)

**01. සේවා ගණය : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

**02. සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‹ආ›, ‹ඇ› සහ ‹ඉ› සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**04. වයස් සීමාව**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය: *

**2020.01.01 දින සිට**

**MA 1-1 : රු. (27,910 - 10 X 300 - 7 X 350 - 4 X 495 - 20 X 660 - 48,540)**

**(රජයේ අනුමත දීමනා එකතුවේ)**

**බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.**

**සේවා කොන්දේසි**

i. මෙම තනතුරු ස්ථිර වන අතර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
ii. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12% ක් සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ද ගෙවනු ලැබේ.

අයදුම්පත් ප්‍රධාන විධායක නිලධාරී, දේශීය ණය සහ සංවර්ධන අරමුදල, අංක 24 /ඒ, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට 2024.07.19 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පතේ ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති**

**දේශීය ණය සහ සංවර්ධන අරමුදල**